# සිංහල සාහිත්‍ය සංග්‍රහය

## (සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා)

## 10-11 ශ්‍රේණි

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල සාහිත්‍ය සංග්‍රහය

**(සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා)**

## ගුරු මාර්ගෝපදේශය

## 10 - 11 ශ්‍රේණි


සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

**සිංහල සාහිත්‍ය සංග්‍රහය**

10 - 11 ශ්‍රේණි

ගුරු මාර්ගෝපදේශය

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .........................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,

ජාතික අධ්‍යාපන ආයතනය,

ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂය මාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

නව විෂය මාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබී ය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතය අඩු කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂය මාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසනු ලැබ ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතන සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතය බැහැර කිරීමට ද සුභාවිතය තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනය විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** - පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය විශේෂඥ උපදෙස් :** මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණු විශ්වවිද්‍යාලය,
මාතර.

**ලේඛක මණ්ඩලය :** ඩී.ඩබ්. දිසානායක,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

තිලිනි රත්නායක,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්. පී. මංගල ගුණරත්න,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විවිධ සහාය :** ඒ. රාජපක්ෂ
නිලූපා අබේරත්න
උපාලි ජයලත්

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සාහිත්‍යය යනු භාෂාවේ අනන්‍යතාව පිළිබිඹු කරන කැඩපතක් වැන්න. භාෂාවක සැබෑ හැඩරුව වටහා ගැනීම සඳහා එම භාෂාවට අයත් සාහිත්‍යය හැදෑරීම ඉමහත් ප්‍රතිඵලදායක වනු ඇත. 'සිංහල භාෂාව හා සාහිත්‍යය' විෂය නිර්දේශය යටතේ 10 හා 11 ශ්‍රේණිවල දී ක්‍රියාත්මක කෙරෙන 'සිංහල සාහිත්‍ය සංග්‍රහය'සම්පාදනය කිරීමේ අරමුණ ශිෂ්‍යයාට වඩා පුළුල් වූ පරාසයකින් සාහිත්‍යය හැදෑරීමට අවකාශ සලස්වා දීම යි. එයට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය මග පෙන්වයි.

10 හා 11 ශ්‍රේණිවල දී සිංහල සාහිත්‍යයට අදාළ ඉගෙනුම් අත්දැකීම් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුත්තේ 'සිංහල භාෂාව හා සාහිත්‍යය' විෂය සඳහා වසරකට වෙන් කර ඇති කාලච්ඡේද අතරින් 60ක ප්‍රමාණයකි. ඒ අනුව සතියකට කාලච්ඡේද 2ක් පමණ ගුරුවරයාගේ අභිමතය පරිදි යොදා ගැනීමට හැකියාව ඇත. ඔබගේ පහසුව පිණිස 'සිංහල සාහිත්‍ය සංග්‍රහය' සඳහා නිර්දිෂ්ට සාහිත්‍ය කෘති, පාසල් වාර සහ කාලච්ඡේද අනුව බෙදා වෙන් කරන ලද සැලසුමක් මේ සමග ඉදිරිපත් කර ඇත.

| වාරය | 10 ශ්‍රේණිය | කාලච්ඡේද සංඛ්‍යාව | 11 ශ්‍රේණිය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | • උම්මග්ග ජාතකය (සතර කන් මන්ත්‍රණයේ සිට ධර්ම යුද්ධය තෙක්) නිපුණතා මට්ටම් - 13.1, 13.2,13.3, 14.1 | 12 | • අමාවතුර (අඟුල්මල් දමනය) නි. ම.- 13.1, 13.2, 13.3, 14.1 | 10 |
| | • ගුත්තිල කාව්‍යය (277 සිට 310 තෙක් කවි) නිපුණතා මට්ටම් - 13.1, 13.2, 14.1 | 08 | • සද්ධර්ම රත්නාවලිය (උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව) නිපුණතා මට්ටම් - 13.1, 13.2, 13.3, 14.1 | 10 |
| 2 | • ජනකවි (හානා හීය පානා අඬහැරෙන් දූනේ) නිපුණතා මට්ටම් - 13.1, 14.3 | 04 | •හංස සන්දේශය (තෝරාගත් කවි 10ක්) නි. ම. - 13.1, 13.2, 14.2 | 08 |
| | • බැද්දේගම (9 පරිච්ඡේදය) නිපුණතා මට්ටම් - 13.1, 13.3, 14.4 | 15 | •සැළලිහිණි සන්දේශය (25-37 කවි) නි. ම. - 13.1, 13.2, 14.2 | 08 |
| | | | •ජනකවි (කුරහන් ඉසිමුව කළුවර බලලා) නිපුණතා මට්ටම් - 13.1, 14.3 | 04 |
| 3 | • ජාතික තොටිල්ල (තෝරාගත් කවි 10ක්) නිපුණතා මට්ටම් - 13.1, 14.5 | 04 | •අපට වැසිකිළියක් නි. ම. - 13.1, 13.3, 14.4 | 06 |
| | | | •දියමන්ති මාලය නි. ම. - 13.1, 13.3, 14.4 | 06 |
| | • ගංගාවේ සංගීතය නිපුණතා මට්ටම් - 13.1, 14.5 | 04 | •දෑතේ කරගැට නිපුණතා මට්ටම් - 13.1, 14.5 | 04 |
| | • සිංහබාහු (දෙවන අංකය) නි. ම. - 13.1, 13.3, 14.6 | 13 | •වස්සානය නිපුණතා මට්ටම් - 13.1, 14.5 | 04 |
| | | 60 | | 60 |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මූලික මග පෙන්වීමක් පමණක් මෙම ගුරු මාර්ගෝපදේශය මගින් සිදු කෙරෙන අතර ශිෂ්‍යයාගේ දැනුම මට්ටමට, ප්‍රාප්ති මට්ටමට හා පන්ති කාමරයෙහි පවත්නා සම්පත්වලට උචිත අයුරින් ස්වකීය ඉගැන්වීම් ක්‍රමවේදය සැලසුම්කර ගැනීමේ නිදහස ගුරුවරයා සතු ය.

ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති ඉගෙනුම් ද්‍රව්‍ය හා අතිරේක පරිශීලනය සඳහා වන ග්‍රන්ථ, ඵලදායී ඉගෙනුම් අත්දැකීමක් සංවිධානය කර ගැනීම සඳහා තව දුරටත් ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ද සුදුසු ඇගයීම් ක්‍රමවේද හා ඇගයීම් උපකරණ තෝරා ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ඒ සඳහා මග පෙන්වීමක් ලබාගත හැකි ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක ගුරු මාර්ගෝපදේශයෙහි ඇතුළත් වෙයි.

**ලේඛක මණ්ඩලය**

## පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂය මාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi -vii |
| විෂය නිර්දේශය | viii - xxvii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම (10 ශ්‍රේණිය) | 2 - 3 |
| උම්මග්ග ජාතකය | 4 - 5 |
| ගුත්තිල කාව්‍යය | 6 - 7 |
| හානා හීය පානා අඬහැරෙන් දැනේ (ජන කවි) | 8 - 9 |
| බැද්දේගම | 10 - 11 |
| ජාතික තොටිල්ල | 12 - 13 |
| ගංගාවේ සංගීතය | 14 - 15 |
| සිංහබාහු | 16 - 17 |
| නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම (11 ශ්‍රේණිය) | 18 - 19 |
| අමාවතුර | 20 - 21 |
| සද්ධර්ම රත්නාවලිය | 22 - 23 |
| හංස සන්දේශය | 24 - 25 |
| සැළලිහිණි සන්දේශය | 26 - 27 |
| කුරහන් ඉසිමුව කළුවර බලලා (ජන කවි) | 28 - 29 |
| අපට වැසිකිළියක් | 30 - 31 |
| දියමන්ති මාලය | 32 - 33 |
| දෑතේ කරගැට | 34 - 35 |
| වස්සානය | 36 - 37 |

# සිංහල සාහිත්‍ය සංග්‍රහය

## විෂය නිර්දේශය

## 10 - 11 ශ්‍රේණි

**(2015 සිට ක්‍රියාත්මක වේ.)**

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

# හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජය ගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. පාසලේ දී අනෙකුත් විෂය හැදෑරීම සඳහා ද සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයවල සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයේ වගකීමක් ලෙස හඳුනාගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තිස්සේ විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. එවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදී මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයෙකි.

මෙම විෂය නිර්දේශයට අදාළ විෂය රාමුවෙහි 6වන ශ්‍රේණියේ සිට 9වන ශ්‍රේණිය තෙක් ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා දියුණු කිරීමට ඉවහල් වන අයුරින් ප්‍රධාන නිපුණතා 12ක් ඉදිරිපත් කර ඇති අතර 10 හා 11 ශ්‍රේණි සඳහා සාහිත්‍ය රසවින්දනය හා විචාරයට අදාළ තවත් නිපුණතා දෙකක් එක් කර ඇත. ඒ අනුව 10 හා 11 ශ්‍රේණි සඳහා නියමිත නිපුණතා සංඛ්‍යාව 14කි. එකී 13 හා 14 නිපුණතා දෙකට අදාළ ව විෂය නිර්දේශයේ මෙම කොටස සකස් කර ඇත. 10 -11 ශ්‍රේණි "සිංහල සාහිත්‍ය සංග්‍රය" පෙළ පොත සකස් වනුයේ විෂය නිර්දේශයේ මෙම කොටස පදනම් කරගෙන ය.

නව විෂය නිර්දේශය සකස් කිරීමේ දී විවිධ භාෂා සඳහා සකස් කරන ලද විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන ලදි. එහි දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මිය සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතා විසින් සකස් කරන ලද "ශ්‍රී ලංකාවේ පාසල්වල 6 - 9 ශ්‍රේණි විෂය සඳහා ප්‍රමිති" (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors - Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I　මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.



II　වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III　මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV　පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V　සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානාත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

IX.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

I සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.



තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

II පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

III පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය: ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව, ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

IV වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

V ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

VI ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

VII "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

## විෂය අරමුණු

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.
2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.
3. සාහිත්‍ය පරිශීලනයෙන් නිරමාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබාගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.
4. විශ්ව විශ්‍රැත සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.
5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන, වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කරගනිමින් රසාස්වාදයට යොමු විම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.
6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.
7. සාහිත්‍යයේ පදනම වන භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ද සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
### 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 13.0 සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | නිර්දිෂ්ට කෘතිවලට අදාළ සාහිත්‍ය පසුබිම සැකෙවින්.<br>- කතුවරයා<br>- ලියැවුණු කාලය<br>- කතුවරයාගේ වෙනත් නිර්මාණ<br><br>10 ශ්‍රේණියට නිර්දිෂ්ට කෘති -<br>• පන්සිය පනස් ජාතක පොත (උම්මග්ග ජාතකය)<br>• ගුත්තිල කාව්‍යය (277-310 කවි)<br>• ජනකවි (හානා හීය පානා අඬහැරෙන් දැනේ)<br>• බැද්දේගම (09 පරිච්ඡේදය)<br>• ජාතික තොටිල්ල (තෝරාගත් කවි 10ක්)<br>• ගංගාවේ සංගීතය<br>• සිංහබාහු (දෙවන අංකය) | • නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |
| | 13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි . | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවීම.<br>• දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කිරීම.<br>• අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කිරීම. (උම්මග්ග ජාතකය හා ගුත්තිල කාව්‍යය) | • උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට පෙළෙහි අර්ථය ලිහිල් බසින් ලියයි.<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය

10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය දැක්වීම.<br>(උම්මග්ග ජාතකය, බැද්දේගම හා සිංහබාහු නාට්‍යය) | • උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.<br>• 'බැද්දේගම'නවකතාවේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.<br>• 'සිංහබාහු' නාට්‍යයේ නිර්දිෂ්ට පෙළ අවබෝධයෙන් යුතු ව කියවා අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |

# සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
### 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 14.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • උම්මග්ග ජාතකය (සතරකන් මන්ත්‍රණයේ සිට ධර්ම යුද්ධය දක්වා) | • නිර්දිෂ්ට ගද්‍ය කොටසේ භාෂා භාවිතය පිළිබඳ අදහස් දක්වයි<br>• අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට ගද්‍ය කොටස රස විඳිමින් විචාරය කරයි. | 12 |
| | 14.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (277 - 310 කවි) | • කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.<br>• නිර්දිෂ්ට පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි. | 08 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.3 ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි. | • හානා හීය පානා අඬහැරෙන් දැනේ<br>(තෝරා ගත් ජනකවි 8ක්) | • නිර්දිෂ්ට ජනකවිවල විශේෂත්වය පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ජනකවිවල ගැබ් වූ උපදේශ හඳුනාගෙන අගය කරයි.<br>• ජනකවි රස විඳිමින් විචාරය කරයි. | 04 |
| | 14.4 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ්<br>( පරිවර්තනය - ඒ. පී. ගුණරත්න)<br>- 09 පරිච්ඡේදය | • 'බැද්දේගම' නවකතාවේ නිර්දිෂ්ට කොටසේ ගැබ් වූ නවකතා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• 'බැද්දේගම' නවකතාව රස විඳිමින් විචාරය කරයි. | 15 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • ජාතික තොටිල්ල - එස්. මහින්ද හිමි<br>(තෝරාගත් කවි 10ක්) | • කවියාගේ අරමුණු හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.<br>• කවි පෙළෙන් ධ්වනිත වන දේශාභිමානී හැඟීම් අගය කරයි.<br>• කවි පන්තිය රස විඳිමින් විචාරය කරයි. | 04 |
| | | • ගංගාවේ සංගීතය - එච්. එම්. කුඩලිගම | • කවි පන්තියේ තේමාව හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කවියේ නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.<br>• කවි පන්තිය රසවිඳිමින් විචාරය කරයි. | 04 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය

**10 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.6 නාට්‍ය රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • සිංහබාහු නාට්‍යය - එදිරිවීර සරච්චන්ද්‍ර<br>(ලෙන අතහැර යාම නමැති දෙවන අංකය) | • නාට්‍ය පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 13 |

**සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)**
**විෂය නිර්දේශය**
11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 13.0 සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි. | නිර්දිෂ්ට කෘතිවලට අදාළ සාහිත්‍ය පසුබිම සැකෙවින්.<br>- කතුවරයා<br>- ලියැවුණු කාලය<br>- කතුවරයාගේ වෙනත් නිර්මාණ<br>11 ශ්‍රේණියට නිර්දිෂ්ට කෘති -<br>• අමාවතුර (අඟුල්මල් දමනය)<br>• සද්ධර්ම රත්නාවලිය (උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව)<br>• හංස සන්දේශය (කවි 10ක්)<br>• සැළලිහිණි සන්දේශය (25 -37 කවි)<br>• ජනකවි (කුරහන් ඉසිමුව කළුවර බලලා)<br>• අපට වැසිකිළියක්<br>• දියමන්ති මාලය<br>• දෑතේ කරගැට<br>• වස්සානය | • නිර්දිෂ්ට කෘතිවල කතුවරයා හා ලියැවුණු කාලය පිළිබඳ හැඳින්වීමක් කරයි.<br>• නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |
| | 13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි . | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවීම.<br>• දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කිරීම.<br>• නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කිරීම. (අමාවතුර, සද්ධර්ම රත්නාවලිය, | • 'අඟුල්මල් දමනය' කතාව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.<br>• සද්ධර්ම රත්නාවලියෙහි නිර්දිෂ්ට පෙළ කියවා අර්ථය ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට සන්දේශ කවිවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | හංස සන්දේශය හා සැළලිහිණි සන්දේශය) | | |
| | 13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය දැක්වීම.<br>(අඟුල්මල් දමනය, උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව, අපට වැසිකිළියක් හා දියමන්ති මාලය) | • 'අඟුල්මල් දමනය' කතාවෙහි අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.<br>• සද්ධර්ම රත්නාවලියෙහි නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය දැක්වීමේ හුරුව ප්‍රදර්ශනය කරයි.<br>• 'අපට වැසිකිළියක්' කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව ඉදිරිපත් කරයි.<br>• 'දියමන්ති මාලය' කෙටිකතාව කියවා අවස්ථා සම්බන්ධය දක්වයි. | නිර්දිෂ්ට කෘතිවලට වෙන් කර ඇති කාලච්ඡේද යොදා ගන්න. |

## සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
### 11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 14.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • අමාවතුර - ගුරුළුගෝමී (අඟුල්මල් දමනය) | • 'අඟුල්මල් දමනය' කතාවෙහි අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• 'අඟුල්මල් දමනය' කතාවෙහි භාෂා භාවිතය අගය කරයි.<br>• 'අඟුල්මල් දමනය' කතාව රස විඳිමින් විචාරය කරයි. | 10 |
| | | • සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන හිමි (උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව) | • 'සද්ධර්ම රත්නාවලිය' කතුරවයාගේ උපමා භාවිත කිරීමේ හැකියාව අගය කරයි.<br>• නිර්දිෂ්ට පෙළෙහි භාෂා රීතිය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය ගැන සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට පෙළ රසවිඳිමින් විචාරය කරයි. | 10 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
### 11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • හංස සන්දේශය - වීදාගම මෛත්‍රේය හිමි (156, 157, 158, 159, 162, 163, 164, 165, 166, 170 කවි) | • නිර්දිෂ්ට සන්දේශ කවිවල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය පන්තියේ රසවත් අවස්ථා මතු කොට දක්වයි.<br>• නිර්දිෂ්ට සන්දේශ කවි රසවිඳිමින් විචාරය කරයි. | 08 |
| | | • සැළලිහිණි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (25 -37 කවි) | • නිර්දිෂ්ට සන්දේශ කවිවල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය පන්තියේ රසවත් අවස්ථා මතු කොට දක්වයි.<br>• නිර්දිෂ්ට සන්දේශ කවි රසවිඳිමින් විචාරය කරයි. | 08 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)
## විෂය නිර්දේශය
11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.3 ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි. | • කුරහන් ඉසිමුව කළුවර බලලා (තෝරා ගත් ජනකවි 8ක්) | • කුරක්කන් කවියෙහි සුවිශේෂතා හඳුනාගෙන විස්තර කරයි.<br>• ජනකවි හා බැඳුණු ගැමි සංස්කෘතික ලක්ෂණ අගය කරයි.<br>• නිර්දිෂ්ට ජනකවි රසවිඳිමින් විචාරය කරයි. | 04 |

**සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)**
**විෂය නිර්දේශය**
**11 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.4. නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • අපට වැසිකිළියක් - කේ. ජයතිලක | • සාහිත්‍යාංගයක් ලෙස කෙටිකතාවේ සුවිශේෂතා විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවේ ගැබ් වූ කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.<br>• 'අපට වැසිකිළියක්' කෙටිකතාව රසවිඳිමින් විචාරය කරයි. | 06 |
| | | • දියමන්ති මාලය - ගී ද මෝපසාං (පරිවර්තනය - කේ. ජී. කරුණාතිලක) | • නිර්දිෂ්ට කෙටිකතාවට පාදක වූ ප්‍රධාන අත්දැකීම හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවේ ගැබ් වූ කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.<br>• 'දියමන්ති මාලය' කෙටිකතාව රසවිඳිමින් විචාරය කරයි. | 06 |

**සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍ය සංග්‍රහය)**
**විෂය නිර්දේශය**
11 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | • දැතේ කරගැට - මහගම සේකර | • කාව්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම හඳුනාගෙන විස්තර කරයි.<br>• නිර්මාණාත්මක භාෂා ලක්ෂණ අගය කරයි.<br>• 'දැතේ කරගැට' නිර්මාණය රස විඳිමින් විචාරය කරයි. | 04 |
| | | • වස්සානය - රත්න ශ්‍රී විජේසිංහ | • කවි පන්තියේ තේමාව හඳුනාගෙන විස්තර කරයි.<br>• කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.<br>• 'වස්සානය' කවි පෙළ රසවිඳිමින් විචාරය කරයි. | 04 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම (10 ශ්‍රේණිය)

**නිපුණතාව :** 13.0 සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය, යුගය හා කතුවරයා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**කාලච්ඡේද :**

ඒ ඒ කෘතියට වෙන් කර ඇති කාලච්ඡේදවලින් කිහිපයක් යොදා ගෙන අදාළ කෘතියේ සාහිත්‍ය පසුබිම සාකච්ඡා කළ යුතු ය.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 10 ශ්‍රේණියට නියමිත සාහිත්‍ය නිර්මාණ හදාරන අවස්ථාවේ දී අදාළ කෘතියේ සාහිත්‍ය පසුබිම සාකච්ඡා කරන්න.
- එහි දී පහත වගුවෙහි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

| කෘතියේ/නිර්මාණයේ නම | කතුවරයා | ලියැවුණු කාලය |
|---|---|---|
| 01. පන්සිය පනස් ජාතක පොත (උම්මග්ග ජාතකය) | අඥාතයි | කුරුණෑගල අවධිය |
| 02. ගුත්තිල කාව්‍යය | වැත්තෑවේ හිමි | කෝට්ටේ අවධිය |
| 03. ජනකවි (හානා හීය පානා අඬහැරෙන් දැනේ | අඥාතයි | අඥාතයි |
| 04. බැද්දේගම (09 පරිච්ඡේදය) | ලෙනාඩ් වුල්ෆ් (පරිවර්තනය - ඒ. පී. ගුණරත්න) | නූතන අවධිය |
| 05. ජාතික තොටිල්ල | එස්. මහින්ද හිමි | නූතන අවධිය |
| 06 ගංගාවේ සංගීතය | එච්. එම්. කුඩලිගම | නූතන අවධිය |
| 07. සිංහබාහු (දෙවන අංකය) | එදිරිවීර සරච්චන්ද්‍ර | නූතන අවධිය |

- නිර්දිෂ්ට නිර්මාණ රචනා වීමේ අරමුණ, කතා සාරය, අන්තර්ගතය, තේමාව යනාදී තොරතුරු කෙටියෙන් හඳුන්වා දෙන්න.
- ඒ ඒ නිර්මාණයට අදාළ වැඩිදුර පසුබිම් තොරතුරු එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ අයත් වන මුල් කෘති
- කතුවරුන්ගේ ඡායාරූප/ආලේඛ්‍ය චිත්‍ර
- කතුවරුන්ගේ වෙනත් පොත පත

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නවකවි සරණිය - විමල් දිසානායක
- සිංහල නවකතා ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්ද්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**නිර්දිෂ්ට කෘතියට අදාළ ව ඇගයීම හා තක්සේරුකරණය සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිය හා කතුවරයා පිළිබඳ හැඳින්වීමක් කරයි.
- විවිධ සාහිත්‍ය අවධි පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
- විවිධ සාහිත්‍ය කෘති පරිශීලනයේ අගය ප්‍රකාශ කරයි
- නිර්දිෂ්ට කෘතියේ පසුබිම් තොරතුරු නිරූපණය වන සටහනක් සකස් කරයි.

# උම්මග්ග ජාතකය

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද : 12 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය කොටසේ භාෂා භාවිතය පිළිබඳ අදහස් දක්වයි
- පෙළෙහි අර්ථය ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට ගද්‍ය කොටසේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට ගද්‍ය කොටස රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- උම්මග්ග ජාතකය හා එහි පසුබිම් තොරතුරු කෙටියෙන් හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට ජාතක කතාවට සවන් දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස සරල ව ඉදිරිපත් කරන්න.
- නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය හා අර්ථය ලිහිල් බසින් ලිවීම කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසේ;
  - නිර්මාණාත්මක භාෂා භාවිතය
  - නාට්‍යානුරූපී දෙබස්
  - කෙටි වැකි
  - උපමා, රූපක ආදී කාව්‍යාලංකාර
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - චරිත නිරූපණය
  - උපහාස, හාස්‍ය ආදී විවිධ රස ජනනය

  යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනයේ හා විචාරයේ යෙදීමට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- උම්මග්ග ජාතකය වැඩිදුර විමර්ශනය කිරීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට ජාතක කතාවේ කියවන ලද කොටසක් ඇතුළත් හඬ පටයක් හෝ සජීවී කියවීමක්
- උම්මග්ග ජාතකය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- ජාතක කතා විමසුම - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල සාහිත්‍යය 4 - ආනන්ද කුලසූරිය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- උම්මග්ග ජාතකයේ පසුබිම විස්තර කරයි.
- අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- පෙළෙහි අර්ථය ලිහිල් බසින් ලියයි.
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

.

# ගුත්තිල කාව්‍යය

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
14.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගෙනුම් පල :**

- ගුත්තිල කාව්‍යයේ පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ගුත්තිල කාව්‍යයේ කතුවරයා, ලියැවුණු කාලය, කතුවරයාගේ සාහිත්‍ය සේවය ආදී පසුබිම් තොරතුරු කෙටියෙන් හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට කවි ශ්‍රවණය කිරීමට හා ගායනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට කවිවල දුරවබෝධ වචන කෙරෙහි අවධානය යොමු කරමින් අර්ථය සරල ව ඉදිරිපත් කරන්න.
- කවිවල අර්ථය ලිහිල් බසින් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කොටසේ;
  - විස්තර කෙරෙන අවස්ථාව
  - කවියාගේ අරමුණ
  - කවියා අනුගමනය කළ රචනා සම්ප්‍රදාය
  - සංකල්ප රූප ජනනය
  - කාව්‍යමය බස් වහර
  - උපමා, රූපක ආදි කාව්‍ය උපක්‍රම භාවිතය

  යන අංග කෙරෙහි අවධානය යොමු කරමින් කවි පෙළ රසාස්වාදයට හා විචාරයට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- ගුත්තිල කාව්‍යය වැඩිදුර විමර්ශනය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට කවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය - කේ. ඩී. පී. වික්‍රමසිංහ
- ගුත්තිල කාව්‍ය විවරණය - සුචරිත ගම්ලත් සහ තවත් අය
- ගුත්තිල ගීතය - මාර්ටින් වික්‍රමසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- ගුත්තිල කාව්‍යයේ පසුබිම ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කවි පෙළ කියවා අර්ථය ලිහිල් බසින් ලියයි.
- කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- නිර්දිෂ්ට කවි රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

# හානා හීය පානා අඬහැරෙන් දැනේ

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.3 ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි.

**කාලච්ඡේද : 04 යි.**

**ඉගෙනුම් පල :**

- ජනකවියෙහි පසුබිම හා පොදු ලක්ෂණ විස්තර කරයි.
- නිර්දිෂ්ට ජනකවිවල විශේෂත්වය පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ජනකවිවල ගැබ්වූ උපදේශ හඳුනාගෙන අගය කරයි.
- ජනකවි රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ජනකවියේ පසුබිම හා පහත ඉදිරිපත් කර ඇති පොදු ලක්ෂණ ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
    - ගැමි ජනතාවගේ නිර්මාණයක් වීම.
    - ගැමි ජනතාවගේ අත්දැකීම් පාදක වීම.
    - හැඟීම් හා සිතුවිලි නිරූපණය කිරීම.
    - සරල භාෂාවක් භාවිත කිරීම.
    - මුඛ පරම්පරාවෙන් පැවත ඒම.
- 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' කවිපෙළ ශ්‍රවණය කිරීමට හා ගායනා කිරීමට සලස්වන්න.
- මේවා උපදේශාත්මක කවි බව හඳුන්වා දෙමින් උපදේශ කවිවල විශේෂත්වය පැහැදිලි කරන්න.
- කවිවලින් ගම්‍ය වන අදහස් පැහැදිලි කරමින් ඒවායේ ගැබ් වූ උපදේශ හඳුනා ගැනීමට සලස්වන්න.
- උපදේශ ඉදිරිපත් කිරීම සඳහා භාෂාව නිර්මාණාත්මක ව යොදාගෙන ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට ජනකවි පෙළ රසවින්දනයට හා විචාරයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- විවිධ වර්ගවල ජනකවි එක් රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට ජනකවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** - -

- ජනකවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ - මිණිවන් පී. තිලකරත්න
- ජනකවි 1 - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- ජනකවිවල පසුබිම හා පොදු ලක්ෂණ විස්තර කරයි.
- නිර්දිෂ්ට ජනකවි පෙළෙහි ගැබ්වූ උපදේශ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ජනකවි රස විඳිමින් විචාරයේ යෙදෙයි.
- උපදේශාත්මක ජනකවි පිළිබඳ තොරතුරු එක් රැස් කරයි.

# බැද්දේගම

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.4 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : **15 යි.**

**ඉගෙනුම් පල :**

- බැද්දේගම නවකතාවේ පසුබිම විස්තර කරයි.
- බැද්දෙේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසේ ගැබ්වූ නවකතා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- බැද්දේගම නවකතාව රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 'බැද්දේගම' නවකතාවේ පසුබිම විස්තර කරන්න.
- 'බැද්දෙේගම' නවකතාව කියවා නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය හඳුනා ගැනීමට යොමු කරන්න.
- පහත සඳහන් නවකතා ලක්ෂණ ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
  - කතා ප්‍රවෘත්තිය
  - දෘෂ්ටි කෝණය
  - චරිත නිරූපණය
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - පසුබිම් නිරූපණය
  - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
- මෙම නවකතා ලක්ෂණ ඇසුරෙන් 'බැද්දේගම' නවකතාවේ නිර්දිෂ්ට පරිච්ඡේදය රසවින්දනය හා විචාරය කිරීම සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (පරිවර්තනය - ඒ. පී. ගුණරත්න )

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සිංහල නවකතා ඉතිහාසය හා විචාරය - එදිරිවීර සරච්චන්
- නවකතා නිර්මාණය හා අවබෝධය - ඒ. වී. සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- බැද්දේගම නවකතාවේ පසුබිම පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- බැද්දේගම නවකතාවේ නවකතා ලක්ෂණ අගය කරයි.
- 'බැද්දේගම' නවකතාවේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- බැද්දේගම නවකතාව රස විඳිමින් විචාරය කරයි.

# ජාතික තොටිල්ල

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද : 04 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කවි පෙළෙහි පසුබිම හඳුනාගෙන විස්තර කරයි.
- කවියාගේ අරමුණු හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- කවි පෙළෙන් ධ්වනිත වන දේශාභිමානී හැඟීම් අගය කරයි.
- කවි පන්තිය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- එස්. මහින්ද හිමියන්ගේ 'ජාතික තොටිල්ල' කවි පෙළෙහි පසුබිම විස්තර කරන්න.
- කවි පන්තිය ශ්‍රවණය කිරීමට හා ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට කවි පෙළෙහි :
  - කවියාගේ අරමුණ
  - කාව්‍යානුභූතිය
  - කාව්‍යමය භාෂාව
  - ඖචිත්‍ය ගුණය
  - සංකල්ප රූප මැවීම
  - සිව්පද ආකෘතිය භාවිත කිරීම.
  - දේශාභිමානී හැඟීම් දැනවීම.

  ආදී ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව රසවින්දනයට හා විචාරයට ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- එස්. මහින්ද හිමියන්ගේ වෙනත් කාව්‍ය නිර්මාණ පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට කවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්
- මහින්ද ප්‍රබන්ධ - සුනිල් ආරියරත්න.

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- නූතන සිංහල කාව්‍ය 1, 2 - ආරිය රාජකරුණා
- නවකවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට කවි පෙළෙහි පසුබිම විස්තර කරයි.
- කවි පෙළෙහි  අරමුණ පැහැදිලි කරයි.
- කවි පන්තියෙන් මතු වන දේශාභිමානී හැඟීම් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි සැලකිලිමත් වෙමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

# ගංගාවේ සංගීතය

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට කවි පෙළෙහි පසුබිම විස්තර කරයි.
- කවි පන්තියේ තේමාව හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කවියේ නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- කවි පන්තිය රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

- එච්. එම්. කුඩලිගමගේ 'ගංගාවේ සංගීතය' කවි පෙළෙහි පසුබිම හඳුන්වා දෙන්න.
- එම කවි පෙළෙහි;
  - අරමුණ
  - කාව්‍යානුභූතිය
  - භාෂාව
  - ඖචිත්‍ය ගුණය
  - සංකල්ප රූප මැවීම
  - ධ්වනිතාර්ථවත් බව

  ආදී ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රස වින්දනය හා විචාරය සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- එච්. එම්. කුඩලිගමයන්ගේ කාව්‍ය නිර්මාණ එක් රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- මන්බැඳි පන්හිඳ - ගීතනාත් කුඩලිගම

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** -

- නූතන සිංහල කාව්‍ය 1, 2 - ආරිය රාජකරුණා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- කාව්‍ය නිර්මාණයෙහි පසුබිම විස්තර කරයි.

- කවියාගේ අරමුණ හා වස්තු විෂය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- කවි පන්තිය රස විඳිමින් විචාරය කරයි.

# සිංහබාහු

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.6 නාට්‍ය රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 13 යි.

**ඉගෙනුම් පල :**

- 'සිංහබාහු' නාට්‍යයෙහි පසුබිම හඳුනාගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ අවබෝධයෙන් යුතු ව කියවා අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- නාට්‍ය පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'සිංහබාහු' නාට්‍යයෙහි පසුබිම විස්තර කරන්න.
- නිර්දිෂ්ට නාට්‍ය කොටසේ දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට යොමු කරන්න.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි අවස්ථා සම්බන්ධය කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- නාට්‍ය පෙළ කියවමින්, ගායනා කරමින්, රංගනයේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට කොටසේ;
  - නාට්‍යෝචිත අවස්ථා
  - කාව්‍යෝපක්‍රම භාවිතය
  - ගීතවත් බස් වහර
  - චරිත නිරූපණය
  - සිද්ධි සහ පසුබිම් නිරූපණය

  යන අංග කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනය හා විචාරය සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.
- 'සිංහබාහු' නාට්‍යය නැරඹීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- 'සිංහබාහු' නාට්‍යයේ නිර්දිෂ්ට කොටස ඇතුළත් සංයුක්ත තැටියක් හෝ සජීවී නාට්‍ය දර්ශනයක්
- සිංහබාහු (නාට්‍ය පෙළ) - එදිරිවීර සරච්චන්ද්‍ර

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සිංහබාහු සම්ප්‍රශංසා - තිස්ස කාරියවසම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- 'සිංහබාහු' නාට්‍යයේ පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියවා අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රසවිඳිමින් විචාරය කරයි.

## නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම (11 ශ්‍රේණිය)

**නිපුණතාව :** 13.0 සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය සහ අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෘතිවල කතුවරයා හා ලියැවුණු කාලය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**කාලච්ඡේද :**

ඒ ඒ කෘතියට වෙන් කර ඇති කාලච්ඡේදවලින් කිහිපයක් යොදා ගෙන අදාළ කෘතියේ සාහිත්‍ය පසුබිම සාකච්ඡා කළ යුතු ය.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 11 ශ්‍රේණියට නියමිත සාහිත්‍ය නිර්මාණ හදාරන අවස්ථාවේ දී අදාළ කෘතියේ සාහිත්‍ය පසුබිම සාකච්ඡා කරන්න.
- එහි දී පහත වගුවෙහි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

| කෘතියේ/නිර්මාණයේ නම | කතුවරයා | ලියැවුණු කාලය |
|---|---|---|
| 1.අමාවතුර (අඟුල්මල් දමනය) | ගුරුළුගෝමී | පොළොන්නරු අවධිය |
| 2.සද්ධර්ම රත්නාවලිය (උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව) | ධර්මසේන හිමි | දඹදෙණි අවධිය |
| 3. හංස සන්දේශය | වීදාගම මෛත්‍රේය හිමි | කෝට්ටේ අවධිය |
| 4. .සැළලිහිණි සන්දේශය | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | කෝට්ටේ අවධිය |
| 5. ජනකවි (කුරහන් ඉසිමුව කළුවර බලලා) | අඥාතයි | අඥාතයි |
| 6. අපට වැසිකිළියක් | කේ. ජයතිලක | නූතන අවධිය |
| 7. දියමන්ති මාලය | ගී ද මෝපසාං | නූතන අවධිය |
| 8. දෑතේ කරගැට | මහගම සේකර | නූතන අවධිය |
| 9. වස්සානය | රත්න ශ්‍රී විජේසිංහ | නූතන අවධිය |

- නිර්දිෂ්ට නිර්මාණ රචනාවීමේ අරමුණ, කතා සාරය, අන්තර්ගතය, තේමාව යනාදී තොරතුරු කෙටියෙන් හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට කෘතිවලට අදාළ වැඩිදුර පසුබිම් තොරතුරු එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ අයත් වන මුල් කෘති
- කතුවරුන්ගේ ඡායාරූප/ආලේඛ්‍ය චිත්‍ර
- කතුවරුන්ගේ වෙනත් පොත පත

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නවකවි සරණිය - විමල් දිසානායක
- සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාශනය - ඒ. වී. සුරවීර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**නිර්දිෂ්ට කෘතියට අදාළ ව ඇගයීම හා තක්සේරුකරණය සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට සාහිත්‍ය කෘතිය හා කතුවරයා පිළිබඳ හැඳින්වීමක් කරයි.
- විවිධ සාහිත්‍ය අවධි පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
- විවිධ සාහිත්‍ය කෘති පරිශීලනයේ අගය ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘතියේ පසුබිම් තොරතුරු නිරූපණය වන සටහනක් සකස් කරයි.

# අමාවතුර

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : **10 යි.**

**ඉගෙනුම් පල :**

- 'අමාවතුර' කෘතියෙහි පසුබිම විස්තර කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කතාවෙහි අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- 'අඟුල්මල් දමනය' කතාවෙහි භාෂා භාවිතය අගය කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 'අමාවතුර' ග්‍රන්ථයෙහි පසුබිම් තොරතුරු කෙටියෙන් හඳුන්වා දෙන්න.
- 'අමාවතුර' ග්‍රන්ථයේ 'අඟුල්මල් දමනය' කතාව ශ්‍රවණය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කරමින් 'අඟුල්මල් දමනය' කතාව අර්ථාවබෝධයට මග පෙන්වන්න.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය හා අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කිරීම කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- 'අඟුල්මල් දමනය' කතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ මතුකොට දක්වන්න.
- 'අඟුල්මල් දමනය' කතාවේ චරිත නිරූපණය ගැන සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය අගයන්න.
- කතාවෙන් ලබාදෙන සදුපදේශ මතුකොට දක්වන්න.
- නිර්දිෂ්ට කතාව රසවිඳිමින් විචාරය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- 'අඟුල්මල් දමනය' කතාවේ කොටසක් ඇතුළත් හඬ පටයක් හෝ සජීවී කියවීමක්
- අමාවතුර - ගුරුළුගෝමී
  (කෝදාගොඩ ඥානාලෝක හිමි සංස්කරණය)

**ගුරුවරයාගේ පරිශීලනය සඳහා**

- සිංහල සාහිත්‍යය 1 - ආනන්ද කුලසූරිය
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- 'අමාවතුර' ග්‍රන්ථය පිළිබඳ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව කියවා අවස්ථා සම්බන්ධය දක්වයි.
- නිර්දිෂ්ට පෙළෙහි අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ අගය කරයි.
- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණයේ දී කතුරවයා දක්වන ප්‍රතිභාව අගය කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව රස විඳිමින් විචාරය කරයි.

# සද්ධර්ම රත්නාවලිය

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.1 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- සද්ධර්ම රත්නාවලියෙහි පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට පෙළ කියවා අර්ථය ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය දක්වයි.
- 'සද්ධර්ම රත්නාවලිය' කතුරවයාගේ උපමා භාවිත කිරීමේ හැකියාව අගය කරයි.
- නිර්දිෂ්ට පෙළෙහි භාෂා රීතිය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය ගැන සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට පෙළ රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

- 'සද්ධර්ම රත්නාවලිය' කෘතියෙහි කතුවරයා, කාලය, අරමුණ, සමකාලීන කතුවරු ආදී පසුබිම් තොරතුරු කෙටියෙන් විස්තර කරන්න.
- නිර්දිෂ්ට කතාවට සවන් දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුවෙහි දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට මග පෙන්වන්න.
- නිර්දිෂ්ට කතාවේ අර්ථය ලිහිල් බසින් ලිවීමට හා අවස්ථා සම්බන්ධය දැක්වීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිර්දිෂ්ට කතාවෙහි;
  - අවස්ථා හා සිද්ධි නිරූපණය
  - චරිත නිරූපණය
  - උපමා භාවිතය
  - භාෂා රීතිය
  - ජීවිත පරිඥානය
  - මානව දයාව

  යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනය හා විචාරය සඳහා ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.

- 'සද්ධර්ම රත්නාවලිය' කෘතිය කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුවෙහි කොටසක් ඇතුළත් හඬ පටයක් හෝ සජීවී කියවීමක්
- සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන හිමි (ප්‍රාචීන භාෂෝපකාර සමිතිය)

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** -

- සිංහල සාහිත්‍යය 2 - ආනන්ද කුලසූරිය
- සිංහල කතා කලාවේ විකාශනය - කේ. ජයතිලක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- සද්ධර්ම රත්නාවලියෙහි පසුබිම විස්තර කරයි.
- 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' කියවා අර්ථය පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට කතාවේ අවස්ථා සම්බන්ධය දක්වයි.
- නිර්දිෂ්ට කතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ අගය කරයි.
- 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' රස විඳිමින් විචාරය කරයි.

# හංස සන්දේශය

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
14.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 8 යි.

**ඉගෙනුම් පල** :

- හංස සන්දේශයෙහි පසුබිම විස්තර කරයි.
- කව්වල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සන්දේශ කව්වල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය පන්තියේ රසවත් අවස්ථා මතු කොට දක්වයි.
- නිර්දිෂ්ට සන්දේශ කවි රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

- හංස සන්දේශයෙහි පසුබිම් තොරතුරු සාකච්ඡා කරන්න.
- කවිපෙළ ශ්‍රවණය කිරීමට හා ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සන්දේශයක මූලික ලක්ෂණ (සන්දේශය යවන්නා, සන්දේශය ලබන්නා, අරමුණු, දූතයා, ගමන් මග, වර්ණනා) කෙටියෙන් හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට කව්වල දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට යොමු කරන්න.
  නිර්දිෂ්ට කව්වල;
  - කාව්‍යානුභූතිය
  - සිව්පද ආකෘතිය
  - කාව්‍යෝක්ති
  - කාව්‍යාලංකාර (උපමා, රූපක, අනුප්‍රාස, එළිවැට, ව්‍යංග්‍යාර්ථ, ධ්වනිතාර්ථ)

  ආදී ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් කවි රසවින්දනයට හා විචාරයට මග පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට කවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්
- හංස සන්දේශය - විදාගම මෛත්‍රෙය හිමි (කේ. ඩී. පී. වික්‍රමසිංහ සහ චාල්ස් ගොඩකුඹුරේ සංස්කරණය)

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** -

- කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය - කේ. ඩී. පී. වික්‍රමසිංහ
- සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාශනය- සුචරිත ගම්ලත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- හංස සන්දේශයේ පසුබිම විස්තර කරයි.
- සන්දේශයක මූලික ලක්ෂණ හඳුන්වයි.
- නිර්දිෂ්ට කවිවල අර්ථය ලිහිල් බසින් ලියයි.
- සන්දේශකරුවා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- නිර්දිෂ්ට කවි රස විඳිමින් විචාරයේ යෙදෙයි.

# සැළලිහිණි සන්දේශය

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.2 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
14.2 පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : **8 යි.**

**ඉගෙනුම් පල** :

- සැළලිහිණි සන්දේශයෙහි පසුබිම විස්තර කරයි.
- කවිවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සන්දේශ කවිවල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය පන්තියේ රසවත් අවස්ථා මතු කොට දක්වයි.
- නිර්දිෂ්ට සන්දේශ කවි රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

- සැළලිහිණි සන්දේශයෙහි පසුබිම් තොරතුරු සාකච්ඡා කරන්න.
- කවිපෙළ ශ්‍රවණය කිරීමට හා ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සන්දේශයක මූලික ලක්ෂණ (සන්දේශය යවන්නා, සන්දේශය ලබන්නා, අරමුණු, දූතයා, ගමන් මග, වර්ණනා) කෙටියෙන් හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට කවි පෙළෙහි දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට යොමු කරන්න.
  නිර්දිෂ්ට කවිවල;
  - කාව්‍යානුභූතිය
  - සිව්පද ආකෘතිය
  - කාව්‍යෝක්ති
  - කාව්‍යාලංකාර (උපමා, රූපක, අනුප්‍රාස, එළිවැට, ව්‍යංග්‍යාර්ථ, ධ්වනිතාර්ථ)
  
  ආදී ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් කවි රසවින්දනයට හා විචාරයට මග පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- නිර්දිෂ්ට කවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්
- සැළලිහිණි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (අශෝක කරුණාරත්න සංස්කරණය)

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා - -**

- මෙමියුරු පදැති සැළලිහිණිය - සුචරිත ගම්ලත්
- කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය - කේ. ඩී. පී. වික්‍රමසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- සැළලිහිණි සන්දේශයෙහි පසුබිම විස්තර කරයි.
- සන්දේශයක මූලික ලක්ෂණ හඳුන්වයි.
- නිර්දිෂ්ට කවිවල අර්ථය ලිහිල් බසින් ලියයි.
- සන්දේශකරුවා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- නිර්දිෂ්ට කවි රස විඳිමින් විචාරයේ යෙදෙයි.

# කුරහන් ඉසිමුව කළුවර බලලා

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.3 ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි.

**කාලච්ඡේද : 04 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට ජනකවිවල පසුබිම හඳුනාගෙන විස්තර කරයි.
- කුරක්කන් කවියෙහි සුවිශේෂතා හඳුනාගෙන විස්තර කරයි.
- ජනකවි හා බැඳුණු ගැමි සංස්කෘතික ලක්ෂණ අගය කරයි.
- නිර්දිෂ්ට ජනකවි රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ජනකවියෙහි පසුබිම පිළිබඳ (10 වන ශ්‍රේණියේ දී උගත් කරුණු ඇසුරෙන්) ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරන්න.
- නිර්දිෂ්ට ජනකවි පන්තිය ශ්‍රවණය කරමින් හා ගායනා කරමින් රස විඳීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් නිර්දිෂ්ට ජනකවි පෙළ රස විඳිමින් විචාරය කිරීමට මග පෙන්වන්න.
  - වෘත්තියක් හා බැඳුණු ජනකවි විශේෂයක් වීම.
  - සිව්පද ආකෘතිය භාවිත කිරීම.
  - ගැමි සිතුවිලි නිරූපණය කිරීම.
  - උචිත හා සරල බස් වහරක් භාවිත කිරීම.
- විවිධ වර්ගවලට අයත් ජනකවි එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිර්දිෂ්ට කවි පෙළෙහි ගායනය ඇතුළත් හඬ පටයක් හෝ සජීවී ගායනයක්
- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** -

- ජනකවි 1 - ජාතික අධ්‍යාපන ආයතනය
- සිව්පද හා සමාජය - නන්දදේව විජේසේකර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට ජනකවිවල පසුබිම විස්තර කරයි.
- ජනකවිවලින් නිරූපණය වන ගැමි සංස්කෘතිය අගය කරයි.
- ජනකවියා යොදාගත් භාෂා උපක්‍රම අගය කරයි.
- ජනකවි පෙළ රස විඳිමින් විචාරය කරයි.

# අපට වැසිකිළියක්

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.4. නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : **06 යි.**

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරයි.
- සාහිත්‍යාංගයක් ලෙස කෙටිකතාවේ සුවිශේෂතා විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ ගැබ් වූ කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.
- 'අපට වැසිකිළියක්' කෙටිකතාව රස විඳිමින් විචාරය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

- 'අපට වැසිකිළියක්' කෙටිකතාවේ පසුබිම් තොරතුරු (කතුවරයා, ලියැවුණු කාලය, සමකාලීන වෙනත් කතුවරු ආදී...) හඳුන්වා දෙන්න.
- 'අපට වැසිකිළියක්' කෙටිකතාව කියවා අවස්ථා සම්බන්ධය හඳුනා ගැනිමට යොමු කරන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවේ;
  - කතා ප්‍රවෘත්තිය
  - දෘෂ්ටි කෝණය
  - චරිතාංග නිරූපණය
  - පසුබිම් නිරූපණය
  - යථාර්ථ නිරූපණය
  - සංකේත නිරූපණය
  - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
  - ඒකාබද්ධතාව

  ආදී කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනයට හා විචාරයට මග පෙන්වන්න.
- වෙනත් කෙටිකතා කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- නොනිමි සිත්තම (කෙටිතකතා සංග්‍රහය) - කේ. ජයතිලක

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා --**

- බවතිමිර (පෙරවදන) - ඒ. වී. සුරවීර
- වහල්ලු (ප්‍රස්ථාවනාව) - මාර්ටින් වික්‍රමසිංහ
- කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම - රංජිත් ධර්මකීර්ති

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාව රසවිඳිමින් විචාරය කරයි.

# දියමන්ති මාලය

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
13.3 නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
14.4 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** :**06 යි.**

**ඉගෙනුම් පල** :

- කෙටිකතාකරුවා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවට පාදක වූ ප්‍රධාන අත්දැකීම හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- කෙටිකතාව කියවා අවස්ථා සම්බන්ධය දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ ගැබ් වූ කෙටිකතා ලක්ෂණ හඳුනාගෙන අගය කරයි.
- 'දියමන්ති මාලය' කෙටිකතාව රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම් තොරතුරු (කතුවරයා, ලියැවුණු කාලය, සමකාලීන වෙනත් කතුවරු ආදී...) හඳුන්වා දෙන්න.
- පරිවර්තිත කෙටිකතාවක විශේෂත්වය පැහැදිලි කරන්න.
- ගී ද මෝපසාංගේ 'දියමන්ති මාලය' කෙටිකතාව කියවා අවස්ථා සම්බන්ධය හඳුනා ගැනීමට යොමු කරන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවේ;
  - කතා ප්‍රවෘත්තිය
  - දෘෂ්ටි කෝණය
  - චරිත නිරූපණය
  - පසුබිම් නිරූපණය
  - යථාර්ථ නිරූපණය
  - සංකේත නිරූපණය
  - නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
  - ඒකාබද්ධතාව

  යනාදී කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනට හා විචාරයට මග පෙන්වන්න.
- පරිවර්තිත කෙටිකතා කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්** :

- දියමන්ති මාලය (කෙටිකතා සංග්‍රහය) - කේ. ජී. කරුණාතිලක

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- මැණික්සාමි සහ තවත් කතා - එදිරිවීර සරච්චන්ද්‍ර සහ ඒ. පී. ගුණරත්න
- ඉටි බෝලය සහ තවත් කතා - කේ. ජී. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට කෙටිකතාවේ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරයි.
- කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය  ඉදිරිපත් කරයි.
- 'දියමන්ති මාලය' කෙටිකතාවේ කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාව රසවිඳිමින් විචාරය කරයි.

# දෑතේ කරගැට

**නිපුණතාව** : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද** : **04 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණයේ පසුබිම විස්තර කරයි.
- කාව්‍ය නිර්මාණයට පාදක වූ අත්දැකීම හඳුනාගෙන විස්තර කරයි.
- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ අගය කරයි.
- 'දෑතේ කරගැට' නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණයේ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරන්න. මෙය මහගම සේකරයන්ගේ 'ප්‍රබුද්ධ' කාව්‍ය ග්‍රන්ථයේ ඇතුළත් වන්නක් බව හඳුන්වා දෙන්න.
- 'දෑතේ කරගැට' කාව්‍ය නිර්මාණයට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- 'දෑතේ කරගැට' කාව්‍ය නිර්මාණයේ,
  - අනුභූතිය
  - භාෂාව
  - කාව්‍යෝපක්‍රම
  - ධ්වනිතාර්ථවත් බව
  - ඖචිත්‍ය ගුණය

  ආදී ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රසවින්දනයට හා විචාරයට මග පෙන්වන්න.
- වෙනත් නූතන කවි රසවිඳීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ප්‍රබුද්ධ - මහගම සේකර

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- නවකවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- නිර්දිෂ්ට නිර්මාණයේ පසුබිම් තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්මාණයේ ගැබ් වූ ජීවන දෘෂ්ටිය හඳුනාගෙන අගය කරයි.
- 'දෑතේ කරගැට' කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

# වස්සානය

**නිපුණතාව :** 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :**

13.1 නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
14.5 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද : 04 යි.**

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට නිර්මාණයෙහි පසුබිම් තොරතුරු ඉදිරිපත් කරයි.
- කවි පන්තියේ තේමාව හඳුනාගෙන විස්තර කරයි.
- කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- 'වස්සානය' කවි පෙළ රසවිඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණයෙහි පසුබිම් තොරතුරු විස්තර කරන්න.
- 'වස්සානය' පද්‍ය පන්තිය කියවා කවියාගේ අරමුණ හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පැදි පෙළෙහි;
  - අනුභූතිය
  - භාෂාව
  - කාව්‍යෝපක්‍රම
  - සංකල්පරූප මැවීම
  - ධ්වනිතාර්ථවත් බව
  - ඖචිත්‍ය ගුණය

  වැනි ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් පද්‍ය පන්තිය රසවින්දනය හා විචාරය සඳහා මග පෙන්වන්න.
- රත්න ශ්‍රී විජේසිංහයන්ගේ වෙනත් කාව්‍ය නිර්මාණ එක් රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- වස්සානය (කාව්‍ය සංග්‍රහය)-  රත්න ශ්‍රී විජේසිංහ
- රත්න ශ්‍රී විජේසිංහයන්ගේ වෙනත් කාව්‍ය නිර්මාණ

**ගුරුවරයාගේ අතිරේක පරිශීලනය සඳහා** -

- නවකවි සරණිය - විමල් දිසානායක

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**මේ සඳහා පහත නිර්ණායක යොදාගන්න.**

- කාව්‍ය නිර්මාණයේ පසුබිම විස්තර කරයි.
- කවි පන්තියේ තේමාව හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- 'වස්සානය' කවි පෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.